| මෙහි රාජ්‍ය ලාංඡනය යොදන්න | **අධිකරණ,රාජ්‍ය පරිපාලන,ස්වදේශීය කටයුතු,පළාත් සභා,පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය**<br>**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය** | |
|---|---|---|

**පුහුණු මධ්‍යස්ථානය හා නේවාසිකාගාරය සඳහා බදු කුලී පදනමින් ගොඩනැගිලි ලබාගැනීමට මිලගණන් කැඳවීම**

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හලාවත නගරයේ පිහිටි පුහුණු මධ්‍යස්ථානය හා නේවාසිකාගාරය පවත්වාගෙන යාම සඳහා හලාවත නගර මාධ්‍යයේ සිට කි. මී. 2 ක් (කි. මී. ප්‍රමාණය ස්ථානය අනුව සලකා බැලිය හැක) ඇතුළත පිහිටි වර්ග අඩි 15000 ක පමණ ඉඩකඩ පහසුකම්වලින් යුතු පුහුණු මධ්‍යස්ථානයකට හා නේවාසිකාගාරයකට සුදුසු නිවසක්/ ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබා ගැනීම සඳහා කෙරෙන විවෘත මිල ගණන් කැඳවීමයි.

**ගොඩනැගිලි සම්බන්ධයෙන් සපුරාලිය යුතු සුදුසුකම්.**

<u>දේශන ශාලා</u>

- **එක් පුහුණු පාඨමාලාවක් සඳහා පුහුණුලාභීන් 40 ක් පමණ සහභාගි කරවීමට හැකි පන්ති කාමර 08 ක් සඳහා ඉඩ පහසුකම් සහිත (එක් කාමරයක වර්ග අඩි 450 ක පමණ) ඉඩ ප්‍රමාණයකින් සමන්විත විය යුතුය.**
- **ඊට අමතරව පහත සඳහන් ආදර්ශ සකස් කිරීම සඳහා පහත දක්වා ඇති එක් එක් ඒකකයක් සඳහා ඉඩ ප්‍රමාණයන් අවශ්‍ය වේ.**

| අංකය | කාර්යාල පරිශ්‍ර පහසුකම් | වර්ග අඩි ප්‍රමාණය |
|---|---|---|
| 1 | ආදර්ශ පැන්ට්‍රි කාමර 01 | 20x15 |
| 2 | ආදර්ශ නාන කාමර 01 | 20x15 |
| 3 | ආදර්ශ නිදන කාමර 01 | 20x15 |
| 4 | ළමා සහ ළදරු රැකවරණය සඳහා කාමර 01 | 20x15 |
| 5 | රෙදි සේදුම් ප්‍රදේශය (Washing area) | 20x15 |
| 6 | රෙදි මැදීම් ප්‍රදේශය (Ironing area) | 20x15 |
| 7 | වාසික කාමර (Living room) | 20x15 |
| 8 | ආහාර ගන්නා ප්‍රදේශය (Dining area) | 20x15 |
| 9 | රෝගී සත්කාරය සඳහා ආදර්ශ කාමරය (Invalid room) | 20x15 |
| 10 | දුවානිය සහ Display area සැදිය හැකි ප්‍රමාණයේ ඉඩ ප්‍රමාණයක් (වර්ග අඩි 10×05 පමණ) | 10x5 |
| 11 | Sick room (පුහුණුලාභීන් රෝගී වූ අවස්ථාවල විවේක ගැනීම සඳහා) | 10x5 |

<u>නේවාසිකාගාර පහසුකම්</u>

- කාන්තා පුහුණුලාභීන් 150 කට පමණ නවාතැන් ගත හැකි ඉඩ ප්‍රමාණයක් සහිත ශාලාවක් (එක් ඇඳකට වර්ග අඩි 25 පමණ) තිබිය යුතුය.
- පුහුණුලාභීන් හට පරිහරණය කිරීම සඳහා වැසිකිළි 15 ක් (කොමඩ් සහිත 01) තිබිය යුතුය. නේවාසිකාගාරය තුළ අවම වශයෙන් වැසිකිළි 02 ක් පිහිටා තිබිය යුතුය
- එකවර පුහුණුලාභීන් 15 කට නාන කරාම පහසුකම් සහිත ස්ථානයක් තිබිය යුතුය
- පුහුණු උපදේශිකාවන් සහ කාන්තා ආරක්ෂක නිලධාරිනිය සඳහා වැසිකිළි හා නාන කාමර පහසුකම් සහිතව කාමර 01 ක් තිබිය යුතුය
- නේවාසිකාගාරය තුළ විදුලි පංකා සවිකර තිබිය යුතු අතර. ප්‍රමාණවත් වාතාශ්‍රය හා ආලෝකය තිබිය යුතුය
- පුහුණුලාභීන්ගේ බෑග් සහ අනෙකුත් බඩු බාහිරාදිය තබා ගැනීමට ඉඩ පහසුකම් තිබිය යුතුය
- එකවර පුහුණුලාභීන් 200 ක පමණ ප්‍රමාණයකට ශාරීරික යෝග්‍යතා ව්‍යායාම කිරීමට සුදුසු වර්ග අඩි 1000 ක පමණ පිට්ටනියක් තිබිය යුතුය
- තේ සෑදීම සඳහා කුඩා ප්‍රමාණයේ මුලුතැන් ගෙයක් තිබිය යුතුය

කාර්යාල පරිශ්‍රය

- කාර්ය මණ්ඩලය 07 දෙනෙක් සඳහා ප්‍රමාණවත් කාර්යාල ඉඩකඩ පහසුකම් තිබිය යුතුය
- 20×20 ප්‍රමාණයේ ගබඩා කාමරයක් තිබිය යුතුය (වර්ග අඩි 400)
- ආරක්ෂක කුටියක් ඉදිකිරීම සඳහා කාර්යාල ප්‍රදේශයේ ඉඩ පහසුකම් තිබිය යුතුය
- පුහුණු මධස්ථානය වටේට ගේට්ටුව සහිත තාප්පයක් තිබිය යුතුය
- අවම වශයෙන් දෛනිකව වාහන 10 ක් පමණ ගාල් කිරීමට ඉඩ පහසුකම් තිබිය යුතුය.
- කාර්ය මණ්ඩලයට හා බාහිර පාර්ශවයන්ට භාවිතා කිරීම සඳහා වැසිකිලි 06 ක් පමණ වෙන් වෙන්ව තිබිය යුතුය.
- සේවා ලබා ගැනීමට පැමිණෙන සේවාලාභීන් 10 කට පමණ එකවර අසුන් ගෙන තම රාජකාරී සේවාව ඉටු කර ගැනීම සඳහා ඉඩ පහසුකම් ගොඩනැගිල්ල ඇතුළත තිබිය යුතුය.
- ඍජු ජල නල සම්බන්ධතාවයක් සමඟ වෙන්වූ ජල මීටරයක් තිබිය යුතු අතර ගොඩනැගිල්ලට ජලය ලීටර් 20,000 ක් පමණ ගබඩා කර තැබිය හැකි ජල ටැංකියක්/ටැංකිවලින් සමන්විය යුතුය.
- පවුලේ දින සහ දේශන පැවැත්වීම සඳහා අවම වශයෙන් 75 කට පමණ රැඳී සිටීමට හැකි දේශන ශාලාවක් තිබිය යුතුය
- ගොඩනැගිලි මාසික බදු පදනම මත ලබා දිය යුතුය.
- මෙම ගොඩනැගිල්ල පොදු ප්‍රවාහන පහසුකම් භාවිතා කර පහසුවෙන් ළඟා විය හැකි වාණිජමය ප්‍රදේශයක් තුල පිහිටිය යුතුය.
- තෙකලා විදුලි සැපයුමක් සමඟ වෙන්වූ විදුලි මීටරයක් තිබිය යුතු අතර. විදුලිය විසන්ධි වූ අවස්ථාවක භාවිතා කිරීමට  විදුලි ජනක යන්ත්‍රයක් තිබීම අමතර සුදුසුකමක් වේ.
- ස්ථාවර දුරකථන පහසුකම් තිබිය යුතුය.
- ප්‍රධාන විදුලිය බෙදාහැරීමේ පුවරුව සහිත මූලික විදුලි පරිපථ පද්ධතිය විදුලි පංකා හා අනෙකුත් උපාංගවලින් සමන්විත විය යුතුය.
- ස්ථානය තෝරාගත් බව දැනුම් දීමෙන් පසු ගොඩනැගිල්ල සම්පූර්ණයෙන්ම වැඩ නිම කර සති 2ක් ඇතුළත ලබාගැනීමේ හැකියාව පැවතිය යුතුය.
- අප ජලය හා මල අපවහන ක්‍රමවේදය විධිමත් පරිදි සකස් කල ගොඩනැගිල්ලක් විය යුතුය.
- කාමර කොටස් කර  ගැනීම කාර්යාංශයට අවශ්‍ය පරිදි සිදු කර ගත හැකි විය යුතුය.
- කාර්යාලය පවත්වා ගෙන යාම නිසා අදාළ ගොඩනැගිල්ල පිහිටි ප්‍රදේශය අවට පදිංචිකරුවන්ට කිසිදු අවහිරතායක් නොවන ස්ථානයක් විය යුතුය.අවට පදිංචිකරුවන් ගෙන් කාර්යාල කටයුතු වලට බාධා නොවන තැනක් විය යුතුයි.
- නිළධාරීන් සඳහා නේවාසික පහසුකම් ලබාගතහැකි අයුරින් වෙන්වූ  කාමර දෙකක් හෝ කීපයක් වැසිකිලි පහසුකම් සහිතව  ගොඩනැගිලි තුල පිහිටීම හා ඒ සඳහා වෙන්වූ ඇතුල්වීමේ දොරටුවක් තිබීම හෝ මෙම පරිශ්‍රයේම මේ සඳහා  ගොඩනැගිල්ලක් පිහිටීම අමතර සුදුසුකමක් වේ.
- බදු දීමනාකරු විසින් සඳහන්  කර ඇති මාසික කුලී මුදල රජයේ තක්සේරු වාර්තාවට යටත්ව ගෙවීම් සිදු කරනු ලබයි. (අවම මුදල)

**ගොඩනැගිලි හිමිකරු විසින් මෙහි සඳහන් ලියකියවිලි වල පිටපත් ඉදිරිපත් කළ යුතුය.**

1. මිල ගණන් පත  සමඟ කාර්යංශය ලබා දෙන ලංසු ලේඛණය
2. මාසික බදු මුදල සඳහන්  ලිපියක්
3. බද්දට අදාළ දේපළේ නිශ්චිත ලිපිනය.
4. ගොඩනැගිලි හිමිකරු අයිතිවාසිකම් ලබාගත් ඔප්පුවෙහි සහතික කරන ලද පිටපතක් හා ඊට අදාළ පත්ඉරු.
5. දේපළට අදාළ පිඹුරුපත.
6. සහතික කරන ලද අනුමත ගොඩනැගිලි සැලැස්ම (අදාළ ගොඩනැගිලි සැලැස්ම A4 ප්‍රමාණයේ හෝ A3 ප්‍රමාණයන්ට කුඩා කර ලබාගත් ඡායාපිටපතක් විය යුතුය).
7. බදු දීමනාකරුගේ නම/ලිපිනය/ජාතික හැඳුනුම්පත් අංකය හා එහි පැහැදිලි ඡායා පිටපතක්.
8. ගොඩනැගිලි හිමිකරුගේ දුරකතන අංකය.
9. අනුකූලතා සහතිකය
10. පසුගිය මාස 06 ඇතුළත ලබාගත් විදුලි, දුරකතන,වරිපනම් ආදී බිල්පත් වල පිටපත්
11. බදු දීමට අපේක්ෂිත අදාළ දේපළ සඳහා හිමිකම් වාර්තාවක් පෙළපතත් සමඟ ඉදිරිපත් කළ යුතු  අතර එය ප්‍රදේශයේ නීතිඥවරයෙකු ලවා පිළියෙළ කර අවසානයේ ඔහුගේ නිර්දේශය ද සහිතව ඉදිරිපත් කළ යුතුය.
12. බදු දීමට අපේක්ෂිත දේපළ සම්බන්ධව පුද්ගලික අයිතියක්  පමණක් නොපෙන්වන අවස්ථාවලදී , එනම්  අදාළ දේපළෙහි පරම අයිතිකරු ශ්‍රී ලංකා ජනරජය වන අවස්ථාවන්හිදී (ස්වර්ණභූමි/ජයභූමි/ප්‍රදාන පත්‍ර/30 අවුරුදු බදු පදනම මත ලබා දී ඇති ඉඩම් ආදී) අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ  අවසරය  සහිත  ලිපියක් සමඟ ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වේ.
13. මේ සම්බන්ධව පහත සඳහන් දුරකථන අංක ඔස්සේ  පමණක්  පැහැදිලි කර ගැනීම් සිදු කර ගන්නා ලෙසත්, අතරමැදියන් හෝ වෙනත් කිසිදු  නිලධාරියෙකු, බාහිර පාර්ශවයක් සමඟ එකඟතාවයන් ඇති කර ගැනීම මෙම ලංසුව ප්‍රතික්ෂේප වීමට හේතු වේ.

ලංසුපත් බත්තරමුල්ල, කොස්වත්ත, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක. 234 හි ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ දෙවන මහලේ පිහිටි ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට 2024.10.29 දින පෙ.ව 11.00 ට හෝ ඊට පෙර බහාලිය යුතුය. ඔබගේ ඉල්ලුම්පත බහාලන කවරයේ වම් කෙලවරේ ඉහළින් **"ගොඩනැගිලි කුලී පදනම මත / බදු පදනමට යටත්ව ප්‍රසම්පාදනය කිරීම. PR/02/04 -1**  යනුවෙන් සඳහන් කළ යුතුය.

කිසියම් අයදුම් පත්‍රයක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාර ගැනීමේ අයිතිය කාර්යාංශයේ ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර, ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ. **රජයේ තක්සේරුකරුගේ වාර්තා වලට යටත්ව තෝරාගැනීම් සිදු කරනු ලැබේ.** ආපසු නොගෙවන  රුපියල් 1000.00 ක මුදලක් 0000001650 කාර්යාංශ ලංකා බැංකු ගිණුමෙහි තැන්පත් කර රිසිට් පත ඉදිරිපත් කර  පහත සඳහන් ලිපිනයන් පිහිටි කාර්යාලයන් මගින් 2024.10.07 දින සිට 2024.10.28 දක්වා කාර්යාලීය වේලාව තුළදී ලංසු ලේඛණ  ලබා ගත හැක.

| | ශාඛා කාර්යාලය | ලිපිනය |
|---|---|---|
| 01 | පුහුණු මධ්‍යස්ථානය - හලාවත | නො.118, මයික්කුලම, හලාවත |

සභාපති - දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය,
අංක.234, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.
දුරකථන/ෆැක්ස්:2880550/2887585
වෙබ් අඩවිය:www.slbfe.lk

SLSI SYSTEM CERTIFIED ISO 9001

**එතෙර සවියට මෙතෙර අත්වැල**